# 5

# රනිල් මංගලගෙන් උගනී ද ?

# මංගල රනිල්ගෙන් උගනී ද ?



**නා**මිකව තවත් දේශපාලන සන්ධානයක් බිහිව ඇත. එය **ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා වන ජාතික සභාව** ලෙස හැඳින්වේ. එසේ වුව ද මෙය, මීට මාස කිහිපයකට පෙර සිට ක්‍රියාත්මක යැයි ප්‍රකට, ජාතික සභාව යන දේශපාලන පක්ෂය යටතට ගැනෙන්නේ දැයි අපැහැදිලි ය. **මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ** නම් වූ දේශපාලන පක්ෂය, අයිතිය සමඟ විශාල පරිවර්තනයකට ලක් කොට ඇතැයි, පසු ගිය දා දැන ගන්නට ලැබුණි. එය අවසානයේ ජාතික සභාව ලෙස හඳුන්වන බව ද සැල විය. මේ වන විට ඒ පිළිබඳව රහස් පොලිස් පරීක්ෂණ ආරම්භ වී ඇති අතර, අදාල දේශපාලන පක්ෂයේ ආරවුල නිරාකරණය කර ගැනීම උසාවිය දක්වා ගොස් ඇත. එ බැවින්, ජාතික සභාව ලියාපදිංචි නිරවුල් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගනු

ඇත්තේ, අධිකරණයෙන් ලැබෙන තීන්දුවත් සමඟ ය. කෙසේ වෙතත් අපිදු දැනට මෙම සන්ධානය **ජාතික සභාව** ලෙස හඳුන්වමු. මෙම ජාතික සභාව එක්සත් ජාතික පක්ෂය ම වීමට බොහෝ දුරට ඉඩ ඇති බව ද අමතක නො කළ යුත්තෙමු.

සන්ධාන කතිකා ලංකා දේශපාලනයේ ගොඩනැඟෙන්නේ අද-ඊයේ නොවේ. සර්වජන ඡන්ද බලය හිමි වූවා යැයි කියන වකවානුවේ සිට, 1977 දක්වා තනි පක්ෂයක් රට පාලනය නො කළ බවට ඕනෑ තරම් සාක්ෂි ඇත. එ මෙන් ම 1930 දශකයේ බිහි වූ ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ පුරෝගාමී පක්ෂ හැරුණු විට, ව්‍යවස්ථාදායකයේ බහුතර බලයක් ගොඩනඟා ගැනීමට අන් කිසිදු පක්ෂයකට නො හැකි විය. 1947 බිහි වන එක්සත් ජාතික පක්ෂ රජය පුරවැසි පනත ගෙන ඒමේ යටි අරමුණක් වූයේ ද එවකට ව්‍යවස්ථාදායකය තුළ වූ වමේ බලය අහිමි කිරීම ය.

එක්සත් ජාතික පක්ෂය තනි පක්ෂයක් ලෙස සුවිශේෂී ජන වරමක් ලබා ලංකා පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ වාර්තාගත ජයක් ලබා ගන්නේ 1977 දී ය. එහෙත් සෞම්‍යමූර්ති තොණ්ඩමන් මහතා සමඟ සන්ධාන ගත ව කටයුතු කිරීමට විධායක බලතල සහිත ජේ.ආර් ගේ දරදඬු හස්තයට පවා සිදු විය. සන්ධාන දේශපාලනය පිළිබඳ කරුණු මෙසේ පෙළ ගැස්වීමට මා පෙළඹෙන්නේ කරුණු දෙකක් මුල් කරගෙන ය. පළමු වැන්න, සම්ප්‍රදායික එක්සත් ජාතික පක්ෂය තුළ වන ඇල්මැරුණු, පසුගාමී, නිදන්ගත රෝගයන්ට ඉන් දිය හැකි ප්‍රතිකාර විග්‍රහ කර ගැනීම ය. දෙ වැන්න සුදර්ශන ගුණවර්ධන විසින් 2006 ජූලි 29 වන දින " **රාවය** " පුවත් පතට ලියන ලද " **දේශපාලන සන්ධාන සහ සන්ධාන දේශපාලනය** " යන දේශපාලන ලිපිය කියවීමෙන් ඇති වූ උනන්දුව යි. සුදර්ශන තම ලිපිය මඟින් න්‍යායාත්මක විග්‍රහයක් කිරීමට බොහෝ දුරට පෙළඹී ඇතත්, ප්‍රායෝගික හෙවත් රටේ බිම් මට්ටමේ ක්‍රියාධරයන්ගේ හැසිරීම් කෙ බඳු වේ දැයි පැහැදිලි කර ගත යුතු යැයි විශ්වාස කරමි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ " **ම** " පාර්ශවය සමඟ එක්සත් ජාතික පක්ෂය එළැඹුණු සන්ධානය 2001 ගොඩනැඟුණු එක්සත් ජාතික පෙරමුණට වඩා වෙනස් බව පවසන සුදර්ශන, දැන් එක්සත් ජාතික පක්ෂය එළැඹ ඇත්තේ බොනපාට්වාදී අකෘතියකට යැයි පවසයි. ඒ සමඟම සියලු දෙනා නියෝජනය කළ හැකි නායකයෙකු සඳහා අවකාශයක් බිහිවීම යැයි එයට වක්‍රව සහතිකයක් ද ලබා දෙයි. බොනපාට්වාදය කෙසේ වෙතත් එවැනි නායකයෙකු වත්මන් සන්දර්භය තුළ බිහිවේ යැයි සිතීම උකසට ය. නමුත් එය සිහිනයක් කර නො ගැනීමේ ඉඩ කඩ ඕනෑ තරම් ඇත. 2001 ගොඩනැඟුණු එක්සත් ජාතික පෙරමුණ හා මෙවර සන්ධානය අතර වන පරස්පරයන් හඳුනාගැනීම ඒ සඳහා සුදුසුම මඟ යි. එක්සත් ජාතික පෙරමුණට වඩා මෙම එකතුව ආකාර කිහිපයකින් වෙනස් බව සත්‍යයකි. ප්‍රධානතම වෙනස නම්, තමන් එක්සත් ජාතික පක්ෂයට වඩා වෙනස් වූ සුවිශේෂී කණ්ඩායමක් ලෙස සමාජය ඉදිරියේ පෙනී සිටීමට උචිත ක්‍රමවේදයන් අතින්, " **ම** " පාර්ශවයට වඩා එක්සත් ජාතික පෙරමුණු කණ්ඩායම පසුගාමී වීම ය. දෙ වැන්න, එම පිලේ සිටි වැඩි දෙනෙක්

පැරණි වම හා නූතන වම නියෝජනය කළා වුව ද, එක්සත් ජාතික පක්ෂය තුළ වෙනසකට එම හැඩයන් උපයෝගී කර නො ගැනීම ය.

සුදර්ශන ගේ සිට බොහෝ දෙනෙකු, අද නව සන්ධානය පිළිබඳව කතා කරනුයේ, මේ නව එකතුව සම්බන්ධ ප්‍රචාරණ ක්‍රියාවලියේ ප්‍රබලතාව හේතුවෙනි. අනෙක් අතට එක්සත් ජාතික පක්ෂය හැර ගිය 17 දෙනාගේ කණ්ඩායමට සිදු වී ඇත්තේ මෙහි විරුද්ධාර්ථයට මුහුණදීමට ය. කවුරු - කෙසේ කීවද 17 දෙනෙකුට වඩා දෙදෙනෙකු සමාජය මත තෙරපුමක් නිර්මාණය කිරීමට සමත්ව ඇත්තේ ( විශේෂයෙන් " **ම** " පාර්ශවයෙන් ) දියත් වන ප්‍රචාරණ යුද්ධය යි. බිම් මට්ටමේ ක්‍රියාධරයන්ගේ හැසිරීම් රටා වෙනස් කරනු ලබන්නේ හා රඳවා ගනු ලබන්නේ ප්‍රචාරණයේ ඇති ප්‍රබලතාව යි. න්‍යායන් - දර්ශනයන් - වාදයන් හෝ උගත් - බුද්ධිමත් හෝ මට්ටම් කෙසේ වෙතත් ලංකාවේ දේශපාලනයේ පෙරළි සඳහා බලපා ඇත්තේ ප්‍රචාරණය යි. කලකට පෙර මංගල විසින්, රනිල් පිස්සු පූසෙකු ලෙස දර්ශනය කරන්නේත්, රනිල් - ප්‍රභා අවබෝධතා ගිවිසුම අලි - කොටි ගිවිසුමක් බවට පරිවර්තනය කරන්නේත්, පස්දුන් කෝරළයේ කතාව ඉතිහාසය විකෘති කිරීමක් ලෙස සමාජයට හුවා දක්වන්නේත්, අත එසවීමේ සිට, ජාතික කොඩිය ප්‍රදර්ශනය කිරීම දක්වා රනිල් රිද්මයක් නැති චරිතයක් බවට ඒත්තු ගන්වන්නේත් මංගලලාගේ ප්‍රචාරණයේ ඇති නිර්මාණශීලී බව සහ ප්‍රබලතාවයි.

දේශපාලනයේ දී අනුගත විය යුතු ප්‍රායෝගික තත්ත්වයන්ට මකියාවේලි ගෙන් අවශ්‍ය තරම් ඌණ පූර්ණයන් ගත හැකි ය. රටේ බහුතරයේ ආගම, ඇදහිලි, සංස්කෘතිය, කලාව ආදී කරුණු වඩාත් වැදගත් ය. එක්සත් ජාතික පක්ෂය පසුගිය ජනාධිපතිවරණයේ දී පළමු පරාජය ලැබුවේ එම අංශයන් ගෙනි. එම පරාජය අත් කරදීම සඳහා මුල සිටම රනිල් ට එරෙහි වූවෝ මංගල සහ ශ්‍රීපති වෙති. එ බැවින් මේ ගමනේ දී වත්මන් එක්සත් ජාතික පක්ෂයට ප්‍රායෝගික දේශපාලන ක්‍රමවේදයන් ඉගැන්වීමට ම පාර්ශවයට සිදුවෙනු ඇත. නො එසේ නම් එය උගෙනීමට වත්මන් එක්සත් ජාතික පක්ෂය නම්‍යශීලි විය යුතු ය. කෙසේ වෙතත් සමගාමී නැවුම් බවක් " **ජන රළ** " තුළ විය. අත් පත්‍රිකා, ප්‍රකාශන, බැනර්, පෝස්ටර්, කටවුට් සහ පෙළපාලිය ආදියේ සිට " **ජන රළ** " රැස්වීම් භූමිය හා ප්‍රධාන වේදිකාව දක්වා එම වෙනස විඳ ගැනීමට එක්සත් ජාතික පාක්ෂිකයන්ට වාසනාව උදා විය. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබලයින් රැසක් ඒ ගැන උද්‍යෝගයෙන් කතා කරනු ඇසිණි. එක්සත් ජාතික පාක්ෂිකයන්, පක්ෂ අභ්‍යන්තරයෙන් අද ඉල්ලා සිටින්නේත් මෙයට සමගාමී වෙනසකි. එස්.බීට, මංගලට, ශ්‍රීපතිට පක්ෂ නායකයාට වඩා ඉහළ ප්‍රතිචාරයක් ලැබුණේ ඒ නිසා ය. ප්‍රාදේශීය තලයේ දී සම්ප්‍රදායික එක්සත් ජාතික පක්ෂ නියෝජිතයන්ට වඩා සංක්‍රමිණකයාට වඩා ඉහළ ප්‍රතිචාර ලැබෙන්නේ ද එ නිසා ය. එය පක්ෂයේ පෝෂණයට ඉවහල් කර ගැනීමට සමත් නො වීම දුර්වලතාවකි. මේ දුර්වලතාව පවතින තාක් බොනපාට්වාදී ආකෘති කොතෙක් ගිල්වුවත් එජාපයේ ජය සීමා සහිත කාලයකට ය.

**"ජන සමාජයක් තුළ දේශපාලන සන්ධාන ඇති වන්නේ, අදාල සමාජ පංති සම්ප්‍රදායික ව නියෝජනය කරන දේශපාලන පක්ෂ, තව දුරටත් එකී පංති නියෝජනය කිරීමට අසමත් වන විට යි."** සුදර්ශනගේ එම විග්‍රහයට එකඟවිය හැකි වුවත්, මෑත බිහි වූ සන්ධාන එම අවශ්‍යතාව ඉටු නො කළේ ය. එවක ජනතා විමුක්ති පෙරමුණේ අශිර්වාදය ද හිමි ව, 1970 දී බලයට පත් වූ සමගි පෙරමුණට වැඩි කල් නො ගොස් සන්නද්ධ කැරැල්ලකට මුහුණ දීමට සිදු විය. සත් වසකට පසුව එම සන්ධානය අන්ත පරාජයට පත් වි ය. 1988 - 89 ජ.වි.පෙ. දෙවන කැරැල්ල සමයේ දී රණසිංහ ප්‍රේමදාස ජනාධිපති කරවීමට ජ.වි.පෙ. ඉතා සූක්ෂම ලෙස සිය බල මුළු මෙහෙය වූ බව දන්නේ අතළොස්සකි. අවසානයේ ජ.වි.පෙ. ට එය පාරාවලල්ලක් වී පසුව එම පාලනය ද අර්බුදයට ගියේ ය. 1995 දී චන්ද්‍රිකා ජනාධිපති කිරීම උදෙසා ජ.වි.පෙ. එයම කළේ ය. ඉනුත් රටට පලක් අත් නොවී තිබිය දී, පරිවාස සන්ධානයකට ගියේ ද ජ.වි.පෙ. ය. පසුව එක්සත් ජනතා නිදහස් සන්ධානය පිහිටුවා ගත්තා පමණක් නොව, ව්‍යවස්ථා දායකයේ බහුතර බලයක් හිමි කර ගෙන සිටි එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව නින්දිත ලෙස විසුරුවා හැරීමටත්, ඉන් නො නැවතී, 1988 - 89 කාලයේ සිදු වූ මානව හිමිකම් උල්ලංඝනයන් හා ජවිපෙ ක්‍රියාධරයන් ඝාතන හමුවේ " **මානව හිමිකම් පප්පා** " ලෙස ජ.වි.පෙ. විසින්ම අන්වර්ත නාමයෙන් හැඳින් වූ මහින්ද රාජපක්ෂ විධායක ජනාධිපති කිරීමටත්, පියවර ගත්තේ ය. 1994 න් පසු මේ සියලු කාර්යයන්ට උර දුන්නේ මංගල ය. අද වන විට එම සන්ධානය ද අර්බුදයට ගොසින් ය. මේ අනුව පැහැදිලි වන්නේ මෙතෙක් බිහි වූ කිසිදු සන්ධානයක්, ඒ සඳහා පෙරමුණ ගත් පංතියේ සැබෑ උවමනාවන් ඉටු කිරීමට සමත් නො වූ බව ය. එ බැවින් සන්ධාන ඇති කිරීම, ඒවා ජයග්‍රහණ කරවීම හා ඒවා අර්බුදයට ගිය කළ හැසිරෙන ආකාරය පිළිබඳ ව මංගලට මනා අවබෝධයක් ඇතිවාට සැක නැත. මෙසේ හෙයින් රනිල් ට මංගලගෙන් උගෙනීමට යමක් ඇත.

තව ද, බොනපාට්වාදී ආකෘතිය එ.ජා.ප.ය තුළට දැන් පැමිණ ඇති හෙයින්, මෙතෙක් සිදු වූ ආකාරයට එ.ජා.ප.ය, ව්‍යාපාරික ප්‍රජාවගේ භෞතික උවමනාවන් පමණක් ඉටු කිරීම වෙතින් ඈත් වෙමින් ඇති බවට සුදර්ශන ඉඟි කරයි. කරු ජයසූරිය වැනි ව්‍යාපාරික ප්‍රජාව නියෝජනය කළ කිහිප දෙනෙකු එජාපයෙන් ඉවත් වීම ඔහු උදාහරණයට ගනී. " ම " පාර්ශවය එසේ නොවේ යැයි කිව හැකි ද ? එක් පසෙකින් " ම " පාර්ශවය නිර්මාණය වන්නේ ද මේ භෞතික උවමනාවන් මහින්ද වෙතින් ඉටු නොවීම මත ය. ඇමති ධූර අහිමි වීමෙන් අනතුරුව, යළි එම ඇමති ධූර ම මිස වෙනත් අමාත්‍ය ධූරයක් ප්‍රතික්ෂේප කිරීමේ අදාල පාර්ශවයේ ප්‍රධානියා ගේ හැසිරීම එයට උදාහරණයකි. ව්‍යාපාරික ප්‍රජාව නියෝජනය කළ කිහිප දෙනෙකු ඇතුළුව 18 දෙනෙකු එජාපයෙන් ඉවත් වන්නේ එ.ජා.ප.ය තුළ බොනපාට්වාදය තහවුරු වන ලකුණු පහළ වූ නිසා නොවේ. ඔවුන් ඉවත් වූ පමණින් අවශේෂ ස්ථරයට එ.ජා.ප.යේ දොරගුළු විවර වී ද නැත.

ආසන සංවිධායක ධූර සහ වගකිව යුතු නිලයන් පිරවීමේ දී ඒ.ජා.ප.ය තවමත් අනුගමනය කරන්නේ පැරණි ක්‍රමවේදය ම ය. විශේෂයෙන්, මුදල් සහ බලය හිමි පාර්ශව ඒ සඳහා සුදුස්සෝ වෙති. එය බොනපාට්වාදය ද? විශේෂයෙන් ප්‍රධාන බලවේග දෙකක් පමණක් නොව ඊට වඩා වැඩි ප්‍රමාණයක් දේශපාලනිකව සමාජය ආමන්ත්‍රණය කරන අවස්ථාවක, ඒවායේ මතවාද පරාජය කළ හැකි බිම් මට්ටමේ ක්‍රියාධරයන්ගෙන් ඉහත කී ස්ථර සමන්විත විය යුතු ය. එ වැන්නක් තවමත් එ.ජා.ප.යෙන් විද්‍යාමාන නො වේ. ප්‍රායෝගික ව මෙම වෙනස්කම් සමඟ සුදර්ශනගේ බලාපොරොත්තු සැසඳේ නම් පමණක් නව සන්ධානයෙන් යහපතක් සිදුවනු ඇත. උතුර කෙසේ වෙතත්, දකුණේ බහුතරයක් පසු ගිය ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කරවමින් බලාපොරොත්තු වූයේ ද එවැන්නකි. එය විමුක්ති කොටි පාර්ශවයේ ද විමසුමට බඳුන් විය.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රායෝගික නායකයෙක් බව, විමුක්ති කොටි විසින් වරක් ප්‍රකාශ කර ඇති බවට වාර්තා පළ විය. එම ප්‍රකාශය පිළිබඳව මේ ලියුම්කරු ද විමුක්ති කොටි දේශපාලන නායකයකුගෙන් ප්‍රශ්න කළ විට ඔහුගේ පිළිතුර වූයේ එය තමන්ගේ මතය නොව දකුණේ ජනතාවගේ මතය බව යි. රනිල්ට වඩා මහින්ද ප්‍රායෝගික යැයි සිතා ඔහු ජයග්‍රහණය කර වීමට දකුණේ ජනතාව ඉදිරිපත් ව ඇති බව පැහැදිලි කළ විමුක්ති කොටි ප්‍රකාශකයා කියා සිටියේ, මහින්ද රාජපක්ෂ දැන් එය ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්විය යුතු බව යි. ඔවුන් අදහස් කළ ප්‍රායෝගික බව කෙසේ වෙතත්, ජනාධිපතිවරණයේ දී දකුණ කුල්මත් කළ යුද වාදය - ජාති වාදය, දැන් ප්‍රායෝගික වී ඇත. එය පරාජය කළ හැක්කේ ජ.වි.පෙ. හෝ සිහළ උරුමය හෝ පෝෂණය වන ආකාරයේ ක්‍රමවේදයන් බැහැර කිරීමට නව සන්ධානය සමත් වන්නේ නම් පමණි.

එ සේ ම නව සන්ධානයේ ඇරඹුම් කරුවන්ගේ ආගමනය පිළිබඳව, අතීත සිදුවීම් හා සැසඳීම ද යුක්ති සහගත ය. මෛත්‍රීපාල. අනුර. චන්ද්‍රිකා - විජය ආදීහු මෙන් තවත් පිරිස් මෙ ලෙස ඔවුන්ගේ සුජාත පක්ෂය හැරදා පැමිණියෝ ය. ඒ අතරින්, පෙර දිනක පක්ෂයට ද්‍රෝහී වූ චන්ද්‍රිකා, පසු කලෙක එම පක්ෂයේම නායිකාව වූවා පමණක් නොව, විධායක ජනාධිපති ධූරය ද හෙබවූවා ය. කෙසේ වෙතත් නව සන්ධානය එක්සත් ජාතික පක්ෂ නායකත්වය යටතේ පවතිනු ඇත. ඇතැම් විට එය එක්සත් ජාතික පක්ෂය ම විය හැකි යැයි මුලින් සඳහන් කළේ ඒ නිසා ය. සුදර්ශන ගුණවර්ධනට අනුව බොහෝ දෙනෙකු මෙම සන්ධානය තුළින් බොනපාට්වාදී ලක්ෂණ මුහුකුරා යාමක් බලාපොරොත්තු වන්නේ නම් එය සුබ වාදී ය. සත්‍ය වශයෙන්ම එසේ නො වන්නේ නම් ඛේදයකි.

සැබෑ ලෙස ම මේ සන්ධානය, ජනතාවාදී සන්ධානයක් බවට පරිවර්තනය වීම සඳහා තවත් බොහෝ අරමුණු සපුරා ගත යුත්තේ ය. එය තව දුරටත් පැහැදිලි කරගැනීම උදෙසා, සුදර්ශන විසින් මෙයට ආරෝපණය කරන බොනපාට්වාදී

ආකෘතිය පිළිබඳ සංවාදය තීව්‍ර තලයකට පිවිසිය යුතු අතර, ව්‍යාපාරික ප්‍රජාවේ අරමුණු ඉටු කිරීම බැහැර කිරීම පමණක් නොව, නිර්ව්‍යාජ ජනතා නියෝජිතයින්ගේ නියෝජනයන් ඒ තුළ ස්ථාපිත වීම දක්වා එය රැගෙන යා යුතු ය. එහි වගකීම පැවරෙන්නේ එක්සත් ජාතික පක්ෂ නායකත්වයට ය. මේ මොහොතේ රනිල් වෙත ය. ජනතාව තමන් වෙත දිනා ගත හැකි මතවාදයන් වත්මන් සමාජ, ආර්ථික. දේශපාලන තලයේ කොතෙක් තිබුණ ද ඒවා නිර්මාණශීලී සහ ස්ථාවර වන ලෙස ප්‍රචාරණයට ඇති නො හැකියාවෙන් මිදීම ඔහු වෙත ඇති එක් අභියෝගයකි. එය එක්සත් ජාතික පක්ෂයට මේ මොහොතේ සන්නිවේදනය කළ හැක්කේ " ම " පාර්ශවයට ය. කඩිකුලප්පුවෙන් තොරව ඉවසීමෙන් යුතුව ඉදිරිය බැලීමට " ම " පාර්ශවය සූදානම් විය යුතු ය. එය ඔවුන් උගත යුත්තේ රනිල් ගෙනි. මෙහි සමබරතාවක් ඇති වුවහොත් රට වෙනුවෙන් සාධනීය බලාපොරොත්තු ගොඩනගා ගැනීමට මේ සන්ධානයට ආදරය කරන්නන්ට හැකි වනු ඇත. කෙසේ වෙතත් අවසන ප්‍රාර්ථනා කළ හැක්කේ, **රනිල් ඔබට සුබ දැක්මක් ! ඔබෙන් රටට සුබ අනාගතයක් !!**

**ජනිත් විපුලගුණ**

2007 අගෝස්තු 03